# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.04 පැය 2300 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/647/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. මනුෂ්‍ය ඝාතනයක් - රක්වාන පොලිස් වසම.

2025.04.04 වන අද දින උදෑසන කාලයේ රක්වාන පොලිස් වසමේ කවුඩුවාව, පහලවත්ත ප්‍රදේශයේදී පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට රක්වාන පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ කවුඩුවාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම බිරිද සමඟ කවුඩුවාව, පහලවත්ත ප්‍රදේශයේ පිහිටි තම කුඹුරට ගොස් සිටියදී පුද්ගලයෙකු තම මවත් සමඟ එම ස්ථානයට පැමිණ ඉඩමක කැඩූ පොල් සඳහා ගෙවිය යුතු රුපියල් 10,000/- මුදලක් ඉල්ලා සිට ඇත. එහිදී ඇතිවූ ආරවුලක් දුරදිග යාමෙන් කුඹුරට පැමිණ සිටි පුද්ගලයාට හා ඔහුගේ බිරිදට මුදල් ඉල්ලා පැමිණි පුද්ගලයා විසින් පොල්ලකින් පහරදී ඇත. පහරදීමෙන් දෙදෙනාම බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා කහවත්ත රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පිරිමි පුද්ගලයා මියගොස් ඇත.

සැකකරු හා සැකකාරිය කවුඩුවාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර ඔවුන් මෙම අපරාධයෙන් පසු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා රක්වාන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදු කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.

2025.04.04 වන අද දින දහවල් කාලයේ ඇටම්පිටිය පොලිස් වසමේ දෙහිවින්න ප්‍රදේශයේදී බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ ද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29,43 හා 68 වයස්වල පසුවන ඇටම්පිටිය, බදුල්ල හා හාලිඇල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඇටම්පිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.